ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

# පුවත්පත් නිවේදනය

## <u>ITEC දින සැමරුමේ දී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අධ්‍යාපන සහ කුසලතා පුහුණු ක්ෂේත්‍රයේ සහයෝගීතාවය තවදුරටත් ඉහළ නැංවීමට කැප වේ</u>

ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතා (ITEC) වැඩසටහන් හරහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ධාරිතා ගොඩනැගීමේ හවුල්කාරිත්වයේ 59 වසරක් සමරමින් කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලද ITEC දින සැමරුම 2023 සැප්තැම්බර් 27 වන දින පැවැත්විණ.

2. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුරේන් රාඝවන් මහතා ද ගෞරවනීය අමුත්තා ලෙස නියෝජ්‍ය මහ කොමසාරිස් ආචාර්ය සත්‍යාංජල් පාණ්ඩේ මහතා ද සහභාගී වූහ. ශ්‍රී ලංකාවේ ITEC ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්, විවිධ ITEC වැඩසටහන් යටතේ ඉන්දියාවේ විවිධ පුහුණු පාඨමාලා සඳහා සහභාගී වූ නොයෙක් ක්ෂේත්‍ර රැසක නිලධාරීන් සහ වෘත්තිකයන් රැසක් ඇතුළු 100ක් පමණ දෙනා මෙම උත්සවයට සහභාගී වූහ.

3. මෙම අවස්ථාව අමතමින් රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුරේන් රාඝවන් මහතා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ඓතිහාසික සමීප සබඳතා සිහිපත් කළේය. සාර්ථක චන්ද්‍රයාන්

මෙහෙයුම සම්බන්ධයෙන් ඉන්දියාවට සිය සුබ පැතුම් එක් කළ ආචාර්ය රාඝවන් මහතා විශේෂයෙන්ම එම චන්ද්‍ර මෙහෙයුමට දායකත්වය ලබා දුන් ඉන්දීය විද්‍යාඥවරියන් අගය කළේය. ITEC අවස්ථාවන් සහ වාර්ෂික ශිෂ්‍යත්ව ශ්‍රී ලාංකිකයන්ට ලබා දීම අගය කළ රාජ්‍ය අමාත්‍යතුමා පසුගිය මාසවල ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබාදුන් මූල්‍ය සහයෝගය සම්බන්ධයෙන් සිය ස්තුතිය පළ කළේය. විශේෂයෙන්ම විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, ගණිතය සහ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය, කුසලතා සංවර්ධනය සහ ධාරිතා ගොඩනැගීම යන අංශයන්හි ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සහයෝගීතාවය තවදුරටත් ඉහළ නැංවීමට ඇති හැකියාව එතුමා විසින් මතු කර පෙන්වන ලදී. තවදුරටත් අදහස් දක්වමින් එතුමා ශ්‍රී ලංකාවේ සංවර්ධනයට පමණක් නොව ඉන්දියා - ශ්‍රී ලංකා සම්බන්ධතාවය ඊළඟ අදියරට ගෙනයාමට ද දායකත්වය ලබා දෙන ලෙස ITEC වැඩසටහන්වල ප්‍රතිලාභීන් ව දිරිගැන්වීය.

4. මෙම අවස්ථාවේ අදහස් දක්වමින් නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේ ITEC වැඩසටහන් සඳහා ශ්‍රී ලාංකික නිලධාරීන් මහත් උනන්දුවක් දක්වන බවයි. දැනට වාර්ෂිකව ලබාදෙන ITEC අවස්ථා 402ට අමතරව ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන අතර සහයෝගීතාවය වැඩි දියුණු කිරීම ඇතුළු දේ හරහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය ඉහළ නැංවීමට ඉන්දියාව ගන්නා ප්‍රයත්නය එතුමා අවධාරණය කළේය. ඉන්දියාව ලොවම එක් පවුලක් හෙවත් 'වාසුධායිව කුටුම්භකම්' යන දර්ශනය මත පදනම් වන බව ද ශ්‍රී ලංකාවේ ධාරිතා සංවර්ධන වැඩසටහන්හි තවදුරටත් පෙරමුණ

ගනු ඇති බව ද නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා සඳහන් කළේය.

5. ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඔවුන් ඉන්දියාවේ දී ලද අත්දැකීම් බෙදා හදා ගත් අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිචාරී ආණ්ඩුකරණය, දේශගුණික විපර්යාස ප්‍රතිපත්ති සංවර්ධනය සහ තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීම සඳහා මූල්‍යනය, සිව්වන කාර්මික විප්ලවයේ හැකියාවන් හා අධ්‍යාපන ආයතනවල 21 වන සියවසේ කුසලතා සමඟ ඒකාබද්ධවීම සහ පාර්ලිමේන්තු සීමාවාසික පුහුණු වැඩසටහන් වැනි විවිධ ක්ෂේත්‍ර ආවරණය කරන ITEC වැඩසටහනේ සාකල්‍ය අන්තර්ගතය අගය කළහ.

6. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා තාක්ෂණික සහයෝගය ලබා දීමට සහ එම රටවල ධාරිතා සංවර්ධනය සඳහා 1964 වසරේ දී ස්ථාපනය කරන ලද ITEC වැඩසටහන ඉන්දීය රජයේ ප්‍රමුඛතම වැඩසටහනකි. එය සහකාර රටවල මානව සම්පත් සංවර්ධනය සඳහා සහය ලබා දෙන වැදගත් මාධ්‍යයක් බවට පත්ව ඇති අතර රටවල් 160ක පුද්ගලයන් 200,000කට අධික සංඛ්‍යාවක් ITEC වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. ITEC වැඩසටහන යටතේ වාර්ෂිකව ශ්‍රී ලංකාවට අවස්ථා 402ක් ලබා දේ. ගෝලීය දකුණ - දකුණ අතර හවුල්කාරීත්වයේ සුවිශේෂී කුළුණක් වන මෙය සමරමින් ලොව පුරා ඉන්දීය තානාපති කාර්යාල විසින් ITEC දිනය සැමරේ.

***

කොළඹ
2023 ඔක්තෝබර් 03